සත්තු වත්තෙ බබාලා

සමුයිල් මාර්ෂක්

අනුවාදය

තක්ෂිලා සමන්ති ජයසේකර

සත්තු වත්තෙ බබාලා



කතාව

සමුයිල් මාර්ෂක්

චිත්‍ර

යෙවිගනී චරුෂින්



අලි පැංචි

සීතල දැනෙද්දිලු,

පළඳින්නේ මේ සපත්තු..

ලස්සනයි තමයි, ඒත් හරි පුංචියිනේ..

මේ රෝස සපත්තු,

ඕහ්! ඊටත් මදිනෙ මේවයින් ජෝඩුවක්,

මට තියෙනවනෙ රවුම්, හැඩ කකුල් හතරක්.

හුරුබුහුටි වුණත් මං, පුංචි අලි පැංචියෙක්.

පිරාෆ් පැටියා



පුංචි ළමයෙක්ට.
හරිම ලේසියි,
බිම පුරා පිපුණු,
මල් නෙළන්නට.
ඒත් තිබුණොතින්..
මගේ තරම් දිගු බෙල්ලක්,
ඒකටත් යනවා
ලොකු පැය ගාණක්.
ඔව්, ඇත්තෙන්ම
ඒක දිගු වේලාවක්..

කොටි පැටවා

මම කොටියෙක් ඔන්න, පූසෙක් හෙම නොවෙයි.

හුරතල් කරන්න හිතන්නවත් එපා!

එහෙම වුණොත් බොහොම භයානක වෙයි.

ඒත් ඉතින්, දැනුත් ඉන්නෙ මට දුක හිතිලා තමයි;

මට ඕනෙ හුඟක් දුර දුවන්න,

කූඩුවක් ඇතුළෙ හිරවෙලා ඉන්න නොවෙයි.

පෙන්ගුයින් පොඩ්ඩෝ

මාත්, නිවුන් සොහොයුරත්..
අදයි බිත්තර කටු බිඳගෙන එළියට ආවෙත්.
කොහෙද අපේ අම්මා?
ඔයා කියන්නෙ කිරිල්ලියක්ද ඇයත්?

තමන්ගෙ නම දන්නැති එකත්,
හරිම ප්‍රශ්නයක්නෙ දැනුත්..
මෙන්න එනවා ලොකුම ලොකු කෙනෙක්,
පේන හැටියට පෙන්ගුයින් පැටවු අපිත්.

මාගෝ නම් වඳුරු පැටවා

මාගෝ කියන්නෙ නමයි මගේ, අලුතින් මෙහෙ ආවේ
අප්‍රිකාවනේ මං ඉපදුණු රට, නැවකිනි මෙහෙ ආවේ
සති ටිකකට කලිනුයි අපි ඔක්කොම, අලුතින් මෙහෙ ආවේ
මටම හැදූ කූඩුවකට දාලයි, මාව අරන් ආවේ

වෙලාවකට මට ගෙදර මතක් වී, ඇඬෙන්නටත් එනවා
ඒත් කෙසෙල් සහ මෝරතෙල් නිසා මට සතුටු හිතෙනවා
හැන්දක් පුරවා, දවසට සැරයක් මේවා මට දෙනවා
හැමෝම මට ආදරෙයි වගේ, මං මේවා ආසාවෙන් කනවා

සීබ්‍රා පැටවු

ඔක්කොම සීබ්‍රාවෝ,
අශ්වයන්ගේ දුර නෑයෝ වෙනවෝ..
මුළු ඇඟ පුරාම සුදු - කළු ඉරිත් තියෙනවෝ.
එකතැන ඉන්න බැරිමයි හිතෙනවෝ.
දුවමින්, සෙල්ලමින්, හැංගිමුත්තමෙන්;
අපි දවසම ක්‍රියාශීලීවත් ඉන්නවෝ.



අලි පොඩ්ඩා

මේ පුංචිම අලි පැංචට,

හරිම, හරිම රස්නෙයිලු..

ඒ රස්නය නැති කරන්න,

වතුර හුඟක් ඕනේලූ..

පුංචි පනිට්ටුවකට එය කරන්න කොහොමත් බෑලූ

ටොන් එකක්ම බර පොඩ්ඩට ගොඩක් වතුර ඕනෙමලූ..

සිංහ පැටවු දෙදෙනා

ඔයාලා දන්නවා නේද තාත්තව අපේ?
සත්තු වත්තෙ ඉන්න සිංහයා තමයි ඒ.
තාත්තාට බර අත්, වගෙම දිග කේසරත් ඇතේ,
'රෝර්..' ගිගුරුමට නම් හොඳටෝම බය හිතේ.
බඩ පිරෙන්නම කන්න ඕන ඒ ඇත්තනේ,
තාත්තාට දෙන්නෙ මස් හොඳම ඒවයින් ඒකනේ.
ඒත් අපි සිංහ පැටවු, අපිට නම් ලැබෙන්නේ,
රස කළ කිරි විතරමයි, ඒ රසය කදිමනේ.

බඩගිනිකාර පුංචි ඔටුවා

කාන්තාරයේ නැවයි කියන්නේ,
ඒකද ඉඳහිට කන්නට දෙන්නේ?
ගොඩාරියක් මට කන්න හිතෙන්නේ,
වරකට පනිට්ටු දෙකකුත් මදිනේ..

හිම වලසුන්

කිමිදෙන්න, පීනන්න, සෙල්ලම් කරන්න,
ලැබෙන චක කදිමයි
ලස්සනම තටාකෙක.
අලුත් කරනා නිසා හැමදාමත් වතුර
නියමයි, ඒ වගේම මෙතන සීතයි.
දුව යන්න ආසයි බිත්තියෙන් බිත්තියට,
ඔයාලට අපිව පරද්දන්නත් බැරිවෙයි.
"දකුණෙන් දිව යන්න, වැඩිපුර ඉඩ තිබේ,
පාගන්නෙපා ඔන්න, මාව කකුලෙන් ඔබේ.."

පුංචි පැස්බරා

ඔති පහයි වයස මට, මං පුංචි පැස්බරෙක්,
ආඩම්බර වගෙම ශක්තිමත් චණ්ඩියෙක්,
අඩිය බිම හප්පනවා ආවොතින් සතුරෙක්,
බිම පහුරු ගානවා මගේ ලොකු ඇඟිල්ලෙන්.

බෙල්ල දිගු කරගෙනයි දුවන්නෙ බය හිතුනොතින්,
ඔයාලට වෙන්නෙ පන්නන්න මා පස්සෙන්,
උත්සාහ කළාට නෑනෙ මට පුළුවන්,
ගී ගයන්නයි, පියාඹන්නයි වගෙ අනෙක් කුරුල්ලන්.

කැන්ගරුවෝ

සත්තු වත්තෙ පැන පැන යන,
මේ දෙන්නගෙ විනෝදයට,
එක් වෙන්නට ආසයි නම්,
වෙන්න වෙනවා කැන්ගරුවෙක්.

පාත්ත පැටියා

පාත්තයෝ ඔක්කෝම එක්කලා,
පාත්ත පැටියත් වතුරට පැනලා.
දැන් වෙව්ලනවා, වතුර බේරෙනවා,
දෙන්න පුළුවන්ද අනේ තුවායක්?

එස්කිමෝ සුනඛයා

එල්ලලා තියෙන පුවරුව වැරදියි,
"ප්‍රවේසම් වෙන්න!" කියන එක සාධාරණ නොවෙයි.
මාව දන්න කවුරුත් එක හඬින් කියයි:
"අහිංසක කම මෙයාගෙ බැටළුවෙක් වගෙයි."
හැම වෙලේම හිතන්නේ මං එකම එක දෙයයි,
අපි හැමෝවම කූඩු කරලා තියෙන එක දුකයි.

පෙන්ගුයින් අයියා

මාව පේන්නේ ගෝනියක් වගේ නොවෙද?
එක පැත්තක් සුදු, අනෙක් පැත්ත කළු.
ඔයා මාව දකින්න තිබ්බෙ ඉස්සර,
වාෂ්ප බෝට්ටුවත් පරද්දන වේගයක් තිබ්බෙ මට.
ඒත් දැන් මම ආසම,
මේ නිස්කලංක පුංචි පොකුණ ළඟ ඉන්න.
කම්මැලියෙක් වෙලා තියෙන්නෙ, එක තැනම
ඉඳලද කොහෙද..

පුංචි බකමූණෝ

මේ පුංචි බකමූණෝ, හොඳම සොහොයුරෝ,
එක තැනක ගුලිවෙලා, ඉන්නටත් සූරයෝ,
අනෙක් අය එක්ක වැඩි ඇයි හොඳයියක් නැතෝ,
නිදන්නයි, බුදින්නයි ආස මේ පොඩිත්තෝ.

ගේ කුරුල්ලා සත්තු වත්තට ඇවිත්

"කියන්න පුංචි ගේ කුරුල්ලෝ,
සත්තු වත්තෙදි කෑම ලැබුණාද?"

"ඔව් ලැබුණා, ඊයෙ උදේ කෑම
සිංහයගේ පිඟානෙන්,

ඊට පස්සේ පොඩි අතුරුපසක්, නරියා ළඟින්.
වතුර ඉල්ලා ගත්තෙ දළ තල්මසාගෙන්,
එයා නම් හරි හොඳයි, මට හිතුණෙ එහෙමයි.



කොකාගෙන් ධාන්‍ය, අලියාගෙන් කැරට්, ගෝවා..
හොඳට මගෙ බඩ පිරෙව්වා.

රයිනෝ බලන්නත්, අමතක කළේ නෑ මං..
එයාගෙන් ලැබුණා ධාන්‍ය නිවුඩු මටත්..

රෑ කෑමට කිඹුල ළඟට,
තව පොඩ්ඩෙන් මමයි රෑ කෑම ඔහුට..!
පෙනුණෙ මට ගේ කුරුලු රංචුවක්මයි,
ඒ බය වෙච්ච තරමට..



සත්තු වත්තෙ බබාලා

කතාව - සමුයිල් මාර්ෂක්

චිත්‍ර - යෙව්ගනී චරුෂින්

අනුවාදය

තක්ෂිලා සමන්ති ජයසේකර

3+ 12-

කඩුල්ල ප්‍රකාශන

kadullabooks.com

LKR 400.00 KADULLA BOOKS

ISBN 978-624-6296-90-2

9 786246 296902

කඩුල්ල පාඨක සමාජය

pinterest.com/kadullapublishers

facebook.com/kadullapublishers

twiter.com/kadullaBooks

+94772583942

+94772583942

කවරය සහ පිටු සැලසුම - පසිදු මිහිරාන් රැවියල